# කුලයෙන් වෑසුණු, අධ්‍යාපනයෙන් විවෘත ඉන්දීය ජනචින්තනය

වටරක්ගොඩ සුමන හිමි

## ප්‍රවේශය

පෙරදිග ලෝකයේ දැනුම් කෝෂ්ඨාගාරය ලෙස සැලකෙන්නේ පුරාණ භාරතයයි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සිට ක්‍රමිකව සංවර්ධනයට ලක් වූ මෙකී බුද්ධිමය ගබඩාව විවිධ ඉසව්වන්ගෙන් පොහොසත් වී ඇත. එම සෑම ඉසව්වක්ම ඉන්දීය ජන චින්තනයේ ප්‍රතිඵලයකි. මෙම ලිපියේ දී අධ්‍යයනය කරනු ලබන්නේ එකී ජන චින්තනයේ නිර්මාණයට, පැවැත්මට හා නව්‍යකරණය වීමට කුලය යන සංකල්පය හා අධ්‍යාපනය යන සංකල්පයේ බලපෑම කවරාකාර විද යන වගයි.

මෙම ලිපියේ මාතෘකාවට අනුව අධ්‍යයනයේ පහසුව තකා මුලින්ම ඉන්දීය ජන චින්තනය යනු කුමක් ද? එහි ස්වභාවයන් කවරේ ද ? යන වග අධ්‍යයනයට බලාපොරොත්තු වේ. ඉනික්බිතිව එකී ජන චින්තනය ආවෘත කොට තැබී සඳහා කුලය යන ඉන්දීය සමාජයේ නොගැලවිමට නොහැකි ලෙස මුල් බැසගෙන ඇති ප්‍රපංචය ඇසුරින් තොරතුරු ගවේෂණය කෙරෙනු ඇත. එකී අධ්‍යයනයෙන් අනතුරුව ඉන්දියානු ජන චින්තනයේ විවෘත භාවය පිණිස අධ්‍යාපනය විසින් ලබාදෙන ලද දායකත්වය හා නායකත්වය පිළිබඳ අවධානය දක්වමින් නිරීක්ෂණය කෙරෙනු ඇත. අනතුරුව කුලය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍ර දෙකට ඉන්දීය ජන චින්තනය තුළ හිමිව ඇති වටිනාකම පිළිබඳ සාපේක්ෂ නිගමනයකට එළඹීමට බලාපොරොත්තු වේ.

## ඉන්දියානු ජන චින්තනය

ඕනෑම රටක ජන චින්තනය ගොඩ නැගෙන්නේ තත්කාලීන සමාජ සංදර්භය තුළ සක්‍රීයව පවතින ආගමික, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික අංග ලක්ෂණයන්ට අනුරූපීයවය. පෞරාණික ඉන්දියානුවාගේ චින්තනය ගොඩ නැගෙන්නේ ද තත් නියමයට අනුවය. ක්‍රි : පූ 2500 ක සාධක සහිත අතීතයකට උරුමකම් කියන හරප්පා සභ්‍යත්වයේ සිට ක්‍රි : ව 1200 දක්වා විසල් කාල පරාසයක



තොරතුරු අධ්‍යයනය හරහා ඉන්දීය ජන චින්තනයේ ස්වභාවය පිළිබඳ තොරතුරු කථනය එතරම් සුකර කටයුත්තක් නම් නොවේ.

සාහිත්‍යයමය මූලයන් හමු නොවන හරප්පාවේ ජන චින්තනය පිළිබඳව යම් පමණකට හෝ තතු විත්ති අනාවරණය කොටගත හැක්කේ පුරාවිද්‍යාත්මක සාධක ඇසුරෙනි. මෙකී සාධක ඇසුරු කරගනිමින් හරප්පා සභ්‍යත්වය අධ්‍යයනය කළ ඒ. එල්. බෂාම් මහතාගේ තොරතුරුවලට[1] අනුව පෙනීයන්නේ ඉන්දු ගඟබඩ දිවිගෙවූ හරප්පා වාසීන් කෘෂිකර්මාන්තයට නැඹුරු මාතෘ මූලිකත්වය මත කටයුතු කළ සරල චින්තනයකින් කටයුතු කළ පිරිසක් බවයි. මිනික්බිතිව එළඹෙන වෛදික යුගය වූ කලී ප්‍රබල න්‍යායාත්මක පසුබිම් යටතේ ජන චින්තනය නිර්මාණය වන යුගයක් ලෙසින් හඳුනාගත හැකිය. වේද ග්‍රන්ථ අධ්‍යයනය තුළ මෙම සමයේ කෙබඳු ආකාර ජන චින්තනයක් පැවතියේදැයි අවබෝධ කොටගත හැකිය.

මෙකල සමාජයේ පැවැත්මට මූලික වන න්‍යායයන් හඳුන්වා දෙනු ලැබුවේ ඍග් වේදය විසිනි. බ්‍රාහ්මණ කුලයේ සමාජ අධිපතිත්වය යටතේ නිර්මාණය වන සමාජ චින්තනයක් මෙකල බිහිවේ.[2] වියතුන් පෙන්වාදෙන ආකාරයට ක්‍රි : පූ 1500-900 ත් අතර කාලයට අයත්වන මෙම චින්තනයේ ජනිතය අද දක්වා ඉන්දියානු සමාජයට බලපෑම් කරමින් සිටිනු දක්නට ලැබේ. මෙම නිර්මාණවාදී දේව සංකල්පය මත සිටගත් පසුකාලීන න්‍යායාචාර්යවරුන් වූ මනු, ශුක්‍ර, බෘහස්පති, යාඥවල්ක්‍ය වැන්නෝ තදීය මතවාදය සවිමත් කරමින් පශ්චාද් වෛදික යුගයන්හි ඉන්දීය ජන චින්තනය සැකසීමේ සුවිසල් ව්‍යායාමයක නිරතව සිටි බැව් හඳුනාගත හැකිය.

තදනන්තරව එළඹෙන්නේ බ්‍රාහ්මණ නිර්මාණවාදී ජන චින්තනයට ප්‍රබල අභියෝගයක් එල්ල කරමින් ඉන්දීය ජන චින්තනයේ විප්ලවීය හැරවුමක ඇරඹුම සනිටුහන් කරන බෞද්ධ යුගයයි. කාල ගත කිරීමේ ක්‍රියාවලිය අනුව මෙම යුගය ක්‍රි : පූ 06 වන සියවස සහ තදාසන්න සමයට අයත්වේ. බුදුන්වහන්සේට අමතරව උතුරු ඉන්දියාව පුරා නව්‍යාකාරයේ චින්තන ක්‍රමවේදයන් හඳුන්වාදීමේදී ජෛන මහාවීර තුමා ආදී ෂට් ශාස්තෘවරුන් මූලිකව ක්‍රියාකොට ඇති බව තත්කාලීන සාහිත්‍ය මූලයන් තහවුරු කොට සිටී.[3] ඒ අනුව මෙකල ජන චින්තනය දෙස බැලීමේදී පෙනීයන්නේ විවිධ න්‍යායයන් මත ගොඩ නැගුණු චින්තනයන් සමුදායකින් ඉන්දියානුවා පොහොසත්ව සිටි බවයි.

උක්ත තොරතුරුවලට අනුව පැහැදිලිවන්නේ ඉන්දියානු ජන චින්තනය සැකසීමට ආගමික සහ සංස්කෘතික කණ්ඩායම් ප්‍රබල ලෙස මැදිහත් වී ඇතිබවයි. මීට අමතරව ඉන්දීය ජන චින්තනය සැකසීම සඳහා රාජ්‍ය බලාධිකාරය ද විසල් බලපෑමක් කොට ඇති බවට තොරතුරු උපුටා දැක්විය හැකිය. නන්ද රාජ වංශය සහ මෞර්ය රාජ වංශය ඒ සඳහා ප්‍රාමාණික උදාහරණයෝ වෙති. මීට අමතරව පෞරාණික ඉන්දියාවේ අන් යුගයන්ට සාපේක්ෂව සංවර්ධනීය යුගයක් ලෙස සැලකෙන ගුප්ත රාජ්‍ය සමයේ රාජ්‍ය ක්‍රියාකාරකම් ද ඉන්දීය ජන චින්තනය නිර්මාණයෙහි ලා බලපෑම් කොට ඇති බව හඳුනාගත හැකිය.

ශක, හූන ආක්‍රමණ පැමිණිය ද 13 වන සියවසේදී සිදුවන මුස්ලිම් ආක්‍රමණ තෙක් පූර්වෝක්තාකාරයට ගොඩ නැගුණු ඉන්දීය ජන චින්තනය පරිකෘතික වශයෙන් වෙනස් කිරීමට නොහැකි වූ බව හඳුනාගත හැකිය. මුසල්මානුවන්ගේ ඉන්දියානු ආගමනයෙන් අනතුරුව ඉස්ලාම් ආගම පදනම් කරගනිමින් නව්‍ය චින්තන ක්‍රමවේදයක් ඉන්දියාව තුළ ක්‍රියාත්මක වීම ඇරඹුව ද සාම්ප්‍රදායික හින්දු ජන චින්තනයට ප්‍රබල බලපෑමක් කිරීමට එයට නොහැකි විය. පසුකාලීනව භාරත මහා දේශය ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය වශයෙන් බෙදී යාමට තවත් හේතු කාරණාවන් සමගින් අත්වැල් බැදගත් ප්‍රබලම සහ ප්‍රධානතම හේතුව ලෙස මෙම ද්විධාකාර හින්දු සහ මුස්ලිම් ජන චින්තනය හඳුනාගත හැකිය. මෙකී සිදුවීම පිළිබඳව සටහන් තැබීම මෙම ලිපියට අදාලත්වයක් නැති බවක් පෙනී ගිය ද මෙය සඳහන් කරනු ලබන්නේ ඉන්දීය ජන චින්තනය කෙතරම් ප්‍රබලදැයි පෙන්වා දීම සඳහාය.

කෘෂිකාර්මික සභ්‍යත්වය මත පිහිටා ගොඩනැගෙන ඉන්දීය ජන චින්තනය, සියවස් ගණනාවක් කාලය හරහා ගමන්කොට විවිධ හැලහැප්පීම්වලට බඳුන්ව සංවර්ධනයට ලක්ව ස්වායක්ත රාජධානි බෙදීම දක්වා කරනු ලැබ ඇති බව උක්ත කතිකාවත තුළින් පැහැදිලි වේ. පරිච්ඡේද ආරම්භයේදී සටහන් කළ ආකාරයට ඉන්දියානු ජන චින්තනය වූ කලී සමාජ ක්‍රමවේදයන් ගණනාවක සම්මිශ්‍රණයේ ප්‍රතිඵලයකි. එම ජන චින්තනය විසින් නව සමාජ ක්‍රමවේද බිහිකිරීම සිදුකරනු ලබයි. එයට කදිම උදාහරණයක් ලෙස බුදුන්වහනසේ පෙන්වා දිය හැකිය. උන්වහන්සේ ඉන්දීය ජන චින්තනයේ අපූර්වතම



ප්‍රතිඵලයක් වූ අතර එකී ප්‍රතිඵලය විසින් නව සමාජ ක්‍රමවේදයක් බිහිකළේය. මෙසේ දක්වූයේ විස්තෘත ඉන්දීය චින්තනයේ සංක්ෂිතයකි.

**කුලයෙන් වැසුණු ඉන්දීය චින්තනය**

කාලානුරූපී ඉන්දීය ජන චින්තනමය විකාසනය තුළ බිහි වූ තත් සමාජ ක්‍රමයට ප්‍රබලම ලෙසින් බලපෑම් කළ නිපදවීමක් ලෙසින් කුලය යන සංකල්පය හඳුනාගත හැකිය. සාධක හමුවන ඉන්දීය ඉතිහාසයේ පෞරාණිකම සමාජ සංස්ථාව වන හරප්පාවේ කුලය පිළිබඳ සංකල්ප කිසිවක් හමුනොවන අතර ඒ පිළිබඳ මූලික හඳුන්වාදීම සිදුකරනු ලබන්නේ ඍග් වෛදික චින්තනය විසිනි. ක්‍රි : පූ 1500 ට ආසන්න කාලවකවානුව තුළ සමාජ අධිපතිත්වය හිමිකරගත් කණ්ඩායම් විසින් විශ්ව නිර්මාපක මහා බ්‍රහ්මන් විසින් සමාජය විවිධ ස්ථරයන් යටතේ නිර්මාණය කොට ඇති බව පෙන්වා දුන්නේය. පිළිවෙළින් මහා බ්‍රහ්මන්ගේ මුඛය, බාහු, කලවා, පාද යන සිවු තැනින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර ජන කොටස් උපත ලද බවත් එම කොටස් උපත ලබන ලද ස්ථානයේ ඉහළතාවය අනුව සමාජ වරප්‍රසාද හිමිවන බවත් ඍග්වේදය පෙන්වා දෙයි.[4]

භාරතී සමාජ පැවැත්මට නියාමනයන් හඳුන්වාදුන් ඍග්වේදය ඉන් නොනැවතී මෙකී සමාජ ස්ථරයන්ට බලපාන වගකීම් සමුදායක් ද හඳුන්වා දී තිබේ එහි එන සඳහනට අනුව සමාජයේ ඉහළින්ම වැජඹුනේ බ්‍රාහ්මණයන්ය. ඔවුන්ට පැවරුණු කාර්යයන් වූයේ ඉගෙනීම, ඉගැන්වීම, යාග කිරීම, යාග කරවීම, දානය හා දාන ප්‍රතිග්‍රහණයයි. [5] සමාජයේ දෙවන ස්ථරය වන ක්ෂත්‍රියන්ට පැවරී තිබුණේ ප්‍රජා පාලනය, දන්දීම, යාග කිරීම, කාමයෙහි නො හැසිරීම[6] යන කරුණුය. බ්‍රාහ්මණ සමාජයේ තෙවන සමාජ ස්ථරායණය නියෝජනය කළ වෛශ්‍යයන්ට පැවරී තිබුනේ ගවා දී පශු පාලනය, දන්දීම, යාග කිරීම, ඉගෙනිම, වෙළෙඳාම, පොලී කිරීම, ගොවිතැන් කිරීම[7] යන කාර්යයන්ය. වර්ණ ධර්මයන්ට අනුව සමාජයේ හතරවන ස්ථානය නියෝජනය කළේ ශුද්‍රයන්ය. ඔවුනට පැවරී තිබුණු එකම කාර්යය වූයේ ත්‍රිවිධ වර්ණයට ඊර්ෂ්‍යා නොකොට හැම දෙනටම මෙහෙ කිරීම පමණකි.[8] මෙයින් පෙනී යන වැදගත් කරුණ වන්නේ උපතින්ම ඔවුනොවුන්ට කිසියම් කාර්යයක් නියම කර ඇති බවය.



02 OCT 2015

බමුණන් සිය බලයෟ යටත් සමාජ ස්ථර කෙරෙහි කෙසේ ආරෝපණය කර ඇති ද යන්න මෙයින් මැනවින් පැහැදිලි වේ.

මෙම ඍග් වෛදික හඳුන්වාදීම් හමුවේ ගොඩනැගෙන චින්තනය ඉන්දියානු ජනයා තදින් වෙලාගන්නාලද බව හඳුනාගත හැකිය. එහි ප්‍රබලතාවය කෙතරම්දැයි වත්මන් ඉන්දියාව දෙස නෙත් යොමු කිරීමෙන් මැනවින් වටහාගත හැකිය. මන්ද මෙසේ කුල වශයෙන් කරන ලද බෙදීම අද පවා ඉන්දියාව තුළ ක්‍රියාත්මක වන බැවිනි. ඒ කෙසේවෙතත් උක්ත නියාමනයන් දේව නියමයන් ලෙසින් සලකා සමාජ ගත කරන බමුණු කුලය සියලු වරප්‍රසාද හිමි කොට්ඨාශය බවට පත්වෙමින් ඉන්දීය ජන චින්තනයේ තීරකයා විය.

මෙලෙස නිර්මාණිත කුල ක්‍රමය විසින් ඉන්දියානු සමාජයේ හතරෙන් තුනකගේ පමණ චින්තන නිදහස අහුරා දමා ඇති බව පැහැදිලි කරුණකි. පූර්වයෙන් දක්වනලද ආකාරයට ඒ ඒ කුලයන්ට නිශ්චිතව පවරන ලද ක්‍රියාකාරකම් මාලාවක් විය. ඒවා ඉක්මවා යාමට කිසිවෙකුට බලයක් නොවීය. එනිසා යම් කුලයක උපන්නෙකුට උපතේ සිට මරණය දක්වා කටයුතු කිරීමටසිදු වූයේ තදීය ක්‍රියාකාරකම්වලට යටත්වය. පූර්ව පරිච්ඡේදයේදී යමෙකුගේ චින්තනය නිර්මාණය වන ආකාරය සටහන් කොට තිබේ. ඒ අනුව මෙම කුල නිර්නායකයන් යටතේ කටයුතු කරන ක්‍ෂත්‍රීය, වෛශ්‍ය, ශුද්‍ර යන කුල තුනට අයත් වූවන්ගේ චින්තනය ක්‍රියාත්මකවන වපසරිය ඉතා සීමිත ප්‍රදේශයකි. බමුණු කුලය විසින් එම කුලයන්ගේ චින්තනය බැමි බැඳ සීමාකොට තිබේ. එසේ වුවත් සමාජ ස්ථරයන්ගේ ඉහළ තලයේ වැජඹෙන බ්‍රාහ්මණයන් සතුව අසීමිත නිදහසක් පැවතුනි. එහෙත් ඔවුන්ගේ චින්තනය තුළ ද විවෘත්ත බවක් දක්නට නොවීය. දෙවියන් පරම නිශ්ඨාව කොට සැලකූ ඔවුහු දෙවියන්ට එහා ගිය සත්‍යයක් ලොව ඇතැයි විශ්වාස නොකළහ. එසේ සිතීම මිත්‍යාවකැයි න්‍යාය ග්‍රන්ථ විසින් පෙන්වාදෙනුලැබීම එයට ප්‍රධාන හේතුවයි.

බ්‍රාහ්මණ මතවාදයන් මතම සිට ගනිමින් එකී මතවාදයන්ම තහවුරු කිරීමට කටයුතු කළ පශ්චාත් කාලීන න්‍යායයාචාර්ය වරුන්ගේ න්‍යාය ග්‍රන්ථ දෙස අවධානය යොමුකිරිමේදී ද පෙනී යන්නේ උක්ත ඍග් වෛදික මතවාදයන්ම තහවුරු කරලමින් පරාධීන ජන චින්තනයක් ගොඩනැගීමට උත්සාහ දරයි. මනු, ශුක්‍ර, යාඥවල්ක්‍ය, බෘහස්පති ආදීහු ඒවායේ ප්‍රමුඛයෝ වෙති. මහා භාරතය, රාමායණය ආදී ආදි ඉන්දීය සාහිත්‍ය ක්ෂේත්‍රය විසින් ද බ්‍රාහ්මණ කුල ක්‍රමයට ජීවය



ලබාදීමට කටයුතු සිදුකොට තිබේ. මෙකී කෘති සියල්ල බ්‍රාහ්මණ චින්තනයේ ප්‍රකාශනයන් වන බැවින් තත් කුල ක්‍රමය විසින් මතු කරනලද ජන චින්තනයේ ස්වභාවය වටහාගත හැකිය. ඒ විසින් ඉන්දියානු ජන චින්තනය පිළිබඳව මතුකෙරෙන සත්‍යය වන්නේ හුදෙක්ම එය වූ කලී දේවත්වයේ බන්ධනය මගින් මඩනාලද කුලය නමැති සීමාවෙන් ඔබ්බට යාගත නොහැකි සිරගත චින්තනයක් බවයි.

## පුරාණ ඉන්දියාවේ අධ්‍යාපනය හා විවෘත ජන චින්තනය

පෞරාණික ඉන්දියාවේ අධ්‍යාපනය සම්බන්ධ තතු විත්ති සොයා යාමේදී ඒ පිළිබඳව පැහැදිලි සාක්ෂි හමුවන්නේ ද ඍග්වේදය තුළිනි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් අක්ෂර සහිත ලේඛන හමුව ඇතත් පැහැදිලිවම ඒ මොනවාදැයි තහවුරු කොටගෙන නොමැත. එනිසා ඍග්වේදයේ අගය තවත් වැඩිවේ. ඍග්වේද යුගයේ ජනයා කියවීමට හෝ ලිවීමට දැනසිටි බවට සාධක හමු නොවන නමුත් සංගීතය , යාඥා, ගීතිකා පිළිබඳව ප්‍රාමාණික දැනුවත් භාවයකින් සිටිබවට තොරතුරු හමු වේ.[9] නමුත් කෙමෙන් සමාජය වර්ධනය වී ඉදිරියට ගමන් කිරීමේදී විවිධ තන්හිදී අධ්‍යාපනය යන ප්‍රපංචය සාකච්ඡාවට ගැනෙන අතර එය වර්ණ ධර්මයන්ගෙන් මුල් වර්ණ තුන ලබනලද අයිතිවාසිකමක් විය.

වෛදික ග්‍රන්ථ තුළ තහවුරු කරනු ලැබ ඇති ආකාරයට මෙලෙස මෙම කුල තුන ලබනලද අධ්‍යාපනය එම කුලයන්ට නිර්දේශ කරඇති ආශ්‍රම ධර්මයන්ට අනුකූල වූවක්ම විය. බ්‍රාහ්මණයන් වේදය ඇතුළු යාග හෝම පිළබඳ අධ්‍යාපනයක් ද ක්‍ෂත්‍රියයන් ශිල්ප හා රාජ්‍ය භාරය දැරීමට අවශ්‍ය දැනුම ද වෛශ්‍යයන් වෙළහෙළදාම පිළිබඳ අධ්‍යාපනයක් ද ලැබිය යුතු විය. ඒ හැර නිදහස් චින්තනය පුළුල් කරන දැනුමක් ඔවුන් විසින් ලබාගන්නාලද බවට කිසිදු තොරතුරක් හමුනොවේ. මෙම අධ්‍යාපනය හුදෙක්ම කුල ක්‍රමය රැකීමේ හා පවත්වාගෙන යාමේ අධ්‍යාපන ක්‍රමයක්ම පමණක් විය.

කුල ක්‍රමය ඉක්මවා යමින් ඉන්දීය ජන චින්තනයේ නව මානයන් සනිටුහන් කරනලද යුගයක උදාව සනිටහන් වන්නේ ක්‍රි : පූ හයවන සියවසේ සහ තදාසන්න සමයේ බිහිවන ඉන්දීයානු ශ්‍රමණ සම්ප්‍රදායේ පිබිදීමත් සමඟිනි. මෙකී පිබිදීම සම්බන්ධයෙන් අදහස් දක්වන එච් . ජී . වේල්ස් නම් වියතා දිගුකලක් ළමා වියේ පසු වූ

ලෝකය උන්හිටි හැටියේ තරුණවීමක් ලෙස හඳුන්වා තිබේ.[10] මෙකී අදහස සැබෑවටම සැබෑවක් බව පෙනී යන්නේ තත් කාල වකවානු පූර්වාපර සන්ධි ගලපා අධ්‍යයනය කරන විටදීය. බුදුරජාණන්වහන්සේ පහළ වූ ක්‍රිස්තු වර්ෂ හයවන සියවස සහ තදාසන්න සමයේ සමයාන්තර දෘෂ්ටීන් හැට දෙකක් පමණ වූ බව දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ.[11] අවුරුදු දහසකට ආසන්න සමයක් තිස්සේ විවිධ ආකෘති ගනිමින් සංවර්ධනයට පත් වෛදික චින්තය මගින් ආවණය කරන ලද ඉන්දීය ජන චින්තනය නව මාවතක් වෙත ගමන් කරවීමේ ඇරඹුම මෙම දෘෂ්ටීන් හැට දෙක මගින් සිදු වූ බව හඳුනාගත හැකිය. මෙකී දෘෂ්ටීන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන කළ පෙනීයන්නේ මේවා සමාජය තුළ ක්‍රමිකව වැඩෙමින් සපැමිණි විවිධ මතවාදයන් රැසක ගොනුවීමේ ප්‍රතිඵලයක් බවයි.

බ්‍රාහ්මණ නිර්මාණවාදී කුල ක්‍රමය මගින් අභිමිකොට දමා තිබූ මානව නිදහස, ඉන්දීය ජන චින්තනය උක්ත ඉගැන්වීම් හරහා ක්‍රමක්‍රමයෙන් ඉදිරියට පැමිණෙයි. මෙම පැමිණීම විවිධ මතවාද උගන්වමින් විශාල අනුගාමික පිරිස් සහිතව කල්ගෙවූ දාර්ශනිකයන් හයදෙනෙකු පිළිබඳ පැහැදිලි තොරතුරු බෞද්ධ මූලාශ්‍රයන්ගෙන් හමුවේ. මොවුන් හඳුන්වා ඇත්තේ ෂට් ශාස්තෲ යන නාමයෙනි. මජ්ඣිම නිකායේ මහා සකුළුදායී, අපණ්ණක, සන්දක යන සූත්‍ර ද අංගුත්තර නිකායේ තිත්ථායන සූත්‍රය හා දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය යනාදිය මෙම ශාස්තෲන් සයදෙනා පිළිබඳ බොහෝ තොරතුරු හමුවන සූත්‍රවේ. සකුළුදායි සූත්‍රයේ සදහන් ආකාරයට එම ආචාර්ය වරුන් හයදෙනා වන්නේ පූර්ණ කාශ්‍යප, මකඛලී ගෝසාල, පකුධ කච්ඡායන, අජිත කේෂකම්බල, සංජය බෙල්ලට්ඨිපුත්‍ර හා නිඝණ්ඨනාථ පුත්‍ර යන සයදෙනාය.[12] අකිරිය වාදය, සංශය වාදය, නාස්තිකවාදය ,අහේතු අප්‍රත්‍ය වාදය යනාදී වාදයන් පිළිබදව ඉන්දියානුවන්ට අධ්‍යාපනය ලබාදෙමින් නව චින්තන ක්‍රමයක් ජනනය කිරීමට මොවුන් වෙහෙසුණු බව පෙනෙයි. මොවුන් පිළිබඳව සදහන් කරන අවස්ථාවන්හි දී ඔවුන් හඳුන්වා ඇත්තේ ''සංඝීචේව ගණි ච ගණාචරියෝ ච'' යන නමිනි. ඉන් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ පිරිස් සහිතව විශාල පිරිසකට ආචාර්යත්වය ලබාදෙමින් වාසය කොටඇති බවයි. මෙම චින්තනයන්හි සත්‍ය අසත්‍ය භාවය වෙනම ම කාරණාවකි. මෙහිදී වැදගත්වන්නේ පැවති ක්‍රමවේදයට කෙතරම් ඉදිරියක් නව ක්‍රමවේද විසින් සනිටහන් කළේද යන වගයි. මානව කණ්ඩායම් මෙම



නව දාර්ශනික ආචාර්යත්වයන් වටා රොක් විමෙන් ම එම දර්ශන යම් ආකාරයක සාර්ථකත්වයක් අත්පත්කරගෙන ඇති බව පැහැදිලිය.

එපමණක්ම නොවේ මේ ආචාර්යවරුන් අතරින් මක්ඛලීගෝසාල, පකුධකච්චායන, අජිත කේශකම්බල යන තිදෙනා බ්‍රාහ්මණ වර්ණ ධර්ම අනුව පහත් කුලයන්ට අයත් වූවන්ය.[13] එහෙත් ඔවුන් විසින් තමන් ලබන ලද අධ්‍යාපනය පදනම් කරගනිමින් විශාල පිරිසක් පිරිවරා සමාජයේ ගෞරවනීය තලයක වැජඹීමට සමත් විය. මේ කරුණ තුළින් පැහැදිලිවම පෙනීයන්නේ පූර්වයෙන් කුලයෙන් ආවෘතව තිබූ ඉන්දීය ජන චින්තනය ක්‍රිස්තු පූර්ව හයවන සියවස සහ තදාසන්න සමයේ අධ්‍යාපනය මගින් විවෘත ජන චින්තනයක් ලෙස හෞතීස්ම කරවන ලද බවයි.

දැනුම සංජානනය කිරීම හරහා ඉන්දීය ජන චින්තනය නිවහල් චින්තනයක් බවට ප්‍රවර්තනය කිරීම සම්බන්ධයෙන් දැවැන්ත ගෞරවයක් හිමිවිය යුත්තේ බුදුන්වහන්සේටය. කුල ක්‍රමය විසින් නිර්මාණය කරතිබූ පරාධීන ඉන්දීය ජන චින්තනය නිවහල් භාවයට පත්කිරීම උන්වහන්සේ සිදුකළේ ප්‍රායෝගිකත්වය කැටි වූ අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවිදයක් හරහාය. සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ ධම්ම පදයේ සඳහන් වන රජ්ජු මාලා, සුනීත, සෝපාක යනාදී කථා වස්තු උක්ත අදහසට නිදර්ශන සපයයි. බුදුන් වඩින මග සුද්ධ කරමින් සිටි සැඩොල් කුල සුනීත මග ඉඩ දී කාණුවකට බැසගත්තේය. එම හැසිරීම තුළ නිරූපණය කරනු ලැබුවේ ඉන්දීය ජන චින්තනයේ ස්වභාවයයි. එහෙත් බුදුන් වහන්සේ එකී චින්තනය ආපිට පෙරලා සුනීත කුණු කාණුවෙන් රැගෙන පූජාසනයක් මත තැබීය.

මෙම කාරණාවන්ට අමතරව අධ්‍යාපනය හරහා ඉන්දීය ජන චින්තනය නිදහස් නිවහල් ඒකකයක් බවට පත්කරන ලද බවට සාධක ථේරීගථා පාළිය සපයයි. අධ්‍යාපනය මතු නොව සමාජමය වශයෙන් මිනිසෙකුට හිමිවිය යුතු කිසිදු වරප්‍රසාධයකට උරුමකම් නොකියූ කාන්තාව දැනුම ලබාගැනීම හරහා ස්වකීය අයිතිවාසිකම් දිනාගන්නා ලද ආකාරය එමගින් කදිමට නිරූපණය කොට තිබේ. මින් පෙනීයන්නේ සමාජයේ අර්ධයක් වූ පුරාණ ඉන්දීය කාන්තාව අධ්‍යාපනය හරහා සිය චින්තනයේ විවෘතභාවයක් ඇතිකරගන්නා ලද බවයි. මෙබදු ආකාර චින්තන නිදහසක් නිර්මාණය වීම හරහා සමාජය තුළ නව මානයන් සනිටුහන් කරනු ලබයි. ගණක මොග්ගල්ලාන සූත්‍රයට අනුව ගණිතඥයන් යනුවෙන් හඳුන්වන ලද පිරිසක් සිටි බව

පෙනෙයි.[14] ගණිතය තුළ '0' නමැති අගය සොයාගන්නා ලද්දේ ආර්ය භට නමැති ඉන්දීය පුත්‍රයා විසිනි.[15] මේ තුළින් තවදුරටත් තහවුරු කරනු ලැබ ඇත්තේ අධ්‍යාපනයෙන් විවෘත ඉන්දීය ජන චින්තනය ලෝක පූජිත වී ඇති බවය.

ආගමකින් මිනිසා අපේක්ෂා කරන්නේ සැනසීමය. එහෙත් බ්‍රාහ්මණ ආගම මගින් සමාජයෙන් හතරෙන් තුනක පමණ සැනසුම අහිමි කොට සීමා බන්ධන පැනවීය. එසේම එමගින් තලාපෙලා දමනලද ඉන්දීය ජන චින්තනයට නව ආලෝකයක් ක්‍රි : ව හයවන සියවසෙන් පසුව උදාවිය . මෙම බලපෑම තත්කාලීන පාලන තන්ත්‍රය වෙළාගැනීමත් සමග නව සමාජ ක්‍රමවේදයන් ගණනාවක් බිහිවිය. එයට කදිම උදාහරණයකක් ලෙස මගධයේ නන්ද රජ පරපුරේ බිහිවීම හඳුනාගත හැකිය. නන්ද රාජ පරපුරේ ආරම්භක පාලකයා වූ මහා පත්ම නන්ද රජු ශුද්‍ර කුලයට අයත් වූවෙකු ලෙස හඳුනාගනී.[16] බ්‍රාහ්මණයන් විසින් ඉතාමත් පහත්ම තත්ත්වයේ ලා සැලකූ ශුද්‍රයෙකු සිහසුන්පත්වීම සැබැවින්ම බමුණු සමාජ ක්‍රමය උඩු යටිකුරු වීමකි. මෙම උඩු යටිකුරු වීම ආකස්මිකව සිදු වූවක් නොවේ. කාලීනව අධ්‍යාපනය මගින් ඉන්දියානු කුලක්‍රමයේ පදනම් දෙදරුම් කැවීම නිසා සිදුවූවක් වේ. එසේම මහා පද්ම නන්දයන් අතිශය බලගතු රජෙකු වූ බවට තත්කාලීන මූලාශ්‍ර සාධක සපයයි. ඒ අනුව පෙනෙන්නේ මහා පද්ම නන්දයන් බුද්ධිමතෙකු වූ බවයි. බුද්ධිමත් භාවය ඉබේ පහළ වන්නක් නොවේ. නිසි ක්‍රමවේදයක් අනුගමනය තුළ ලැබිය යුත්තකි. ශුද්‍රයෙකු වූ නන්ද රජු අධ්‍යාපනය ලද්දෙකු බව ඒ තුළ ගම්‍යමාන වේ. ඒ අනුව පෙනී යන්නේ විසල් මනසකින් ලෝකය දැකිය හැකි චින්තනයකින් හෙබි මිනිසුන් අධ්‍යාපනය මගින් නිර්මාණය කොට ඇති බවය.

## නිගමනය

ක්‍රමක්‍රමයෙන් ගොඩ නැගී ලෝකය මවිත කරවන බුද්ධිමය නිර්මාණයන් බිහිකරලීමට ඉන්දීය ජන චින්තය සමත්ව ඇති බව උක්ත අධ්‍යයනයන් තුළින් මොනවට පැහැදිලි වේ. ඍග් වෛදික නියමයන් විසින් එක් කොටසක් පමණක් වරප්‍රසාද හිමි පැලැන්තියක් බවට පත් කරමින් හඳුන්වා දෙන ලද නියාමනයන් විසින් ඉන්දියානු ජන චින්තනය අඳ ,ගොළු , බිහිරි චින්තනයක් බවට පත් කොට තිබුණි. පුරාණ ඉන්දියාවේ සමාජ බලය අත්පත් කරගෙන සිටි බ්‍රාහ්මණයන්



ස්වකීය උවමනාව මත වර්ණ ධර්ම හරහා තහවුරු කරන ලද කුල ක්‍රමයෙන් ඉන්දීය ජන චින්තනය සම්පූර්ණයෙන්ම පාහේ ආවෘත කොට තිබූ බව උක්ත අධ්‍යයනය තුළ තහවුරු වේ.

කුලය නමැති යකුළු පහරින් තළා පෙළා මිලින කර තිබූ ඉන්දීය ජන චින්තනය ප්‍රාණවත් කොට පුබුදුවාලූයේ අධ්‍යාපනය නමැති ජීව වායුව විසිනි. කුල ක්‍රමයේ පීඩනයට එරෙහිව නැගී සිටි ශ්‍රමණ සම්ප්‍රදායේ උදාවත් සමඟ දියුණුවන නව චින්තනයේ අධ්‍යාපන ක්‍රමවේදය තුළින් ප්‍රකාශිත වැදගත්ම ප්‍රතිඵලය නිදහස් ඉන්දියානු චින්තනයයි. කුලයේ ආධිපත්‍යය විසින් වසාගෙන තිබූ ඉන්දීය ජන චින්තනයේ කඩතුරා අධ්‍යාපනය හරහා ඉවත් කොට ඉන්දියනු දේශයේ ගමන් මග නව්‍යකරණයකට ලක්කරන ලද බව උක්ත අධ්‍යයනය විසින් මැනවින් තහවුරු කොට සිටී.

## ආන්තික සටහන්

[1] ඒ .එල් බෂාම් , අසිරිමත් ඉන්දියාව , දෙහිවල : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව , 1995 , පි . 13 -17

[2] , 'බ්‍රාහ්මණොස්‍ය මුඛ මාසීත් - බාහු රාජන්‍යඃ කෘතඃ - ඌරුතදස්යද් වෛශ්‍යං - පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත' ukqiauD;sh, පරි. පියදාස නිශ්ශංක, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1991, පි. 29-31

[3] §> ksldh, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා , දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය , 2005, පි. 215

[4] , 'බ්‍රාහ්මණොස්‍ය මුඛ මාසීත් - බාහු රාජන්‍යඃ කෘතඃ-ඌරුතදස්යද් වෛශ්‍යං - පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත' ආතර් ඇනතනි මැක්ඩොනල්ගේ R.afõo.S;dj, (10 වන මණ්ඩලය, 90 වන පුරුෂ සූත්‍රය), පරි. නාරාවිල පැට්රික්, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1997, පි. xxix.

[5] , 'අධ්‍යාපන මධ්‍යයනං - යජනං යාජනං තථා - දානං ප්‍රතිග්‍රහනං චෛව - බ්‍රහ්මණනාමකල්පයත්' ආරියදාස සෙනෙවිරත්න, ukqiauD;sh iy udkj YsIagdpdrh" කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001,පි. 21. ශ්ලෝක 1- 89.

[6] , 'ප්‍රජානං රක්‍ෂණං දාන - මිජ්‍යාධ්‍යයනමේ ච - විෂයේෂ්ච ප්‍රශක්තිශ්ච - ක්‍ෂත්‍රියස්‍ය සමාසතඃ ***එම***, පි. 21. ශ්ලෝක 1 - 90.

[7] , පශුනාං රක්‍ෂණං දාන-මිජ්‍යාධ්‍යයනමේව ච-වණික්පථං කුසීදං ච - වෛශ්‍යස්‍ය කෘෂිමෙව ච' ***එම***, පි. 21. ශ්ලෝක 1 - 91.

[8] , 'එක මෙවතු ශුද්‍රස්‍ය - ප්‍රභු කර්ම සමාදිශත් -ඒතේශාමේව වර්ණානම් - ශුශ්‍රෑසා මනුශුයසා' ***එම***, පි. 21. ශ්ලෝක 1 - 92.

[9] සිරිමල් රනාවැල්ල ඇතුළු පිරිස, bkaÈhdfõ b;sydih, කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007 , පි. 111

[10] දියගම නාරද හිමි, IÜ Ydia;DDka iy nqÿ oyu, නුගේගොඩ : කතෘ ප්‍රකාශන , 2009 , පි . 29

[11] දීඝ නිකාය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005, පි. 90



[12] " අයම්පි බෝ පූරාණ කස්සපෝ සංඝීචේව ගණිච ගණාචරියෝච ඤාතෝ යසස්සී සාධු සම්මතෝ බහුජනස්ස සෝපි රාජගහං වස්සාවාසං ඔසටයෝ . අයම්පි මක්ඛලී ගෝසාලෝ ..... අජිත කේෂකම්බලී ..... පකුධකච්චායනෝ ..... සංජය බෙල්ලට්ඨී පුත්තෝ ..... නිඝණ්ඨනාථපුත්තෝ ..... රාජගහං වස්සාවාසං ඔසටයෝ . "
මජ්ඣිම නිකාය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005, පි. 334

[13] දීඝ නිකාය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005, පි. 90 -110

[14] බන්දුල ශ්‍රී ගුණවර්ධන, බුද්ධ කාලීන භාරත සංස්කෘතිය, කොළඹ : ඇම් . ඩී . ගුණසේන සහ සමාගම, 1964, පි. 111

[15] ඒ .එල් බෂාම්, අසිරිමත් ඉන්දියාව, දෙහිවල : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1995, පි . 617

[16] සිරිමල් රනාවැල්ල ඇතුළු පිරිස, ඉන්දියාවේ ඉතිහාසය, කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007 , පි.149